# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2394/55 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජනාධිපතිවරණය - 2024**

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 119 ආ වැනි වගන්තිය

**නියමිත ඡන්ද පොළක දී ඡන්දය දීමට නොහැකිවීම පිළිබඳ සාධාරණ බියක් ඇති විට ඡන්දය දීමේ කාර්ය පටිපාටිය**

තමාගේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන, එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය දීම සඳහා පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලුම් කළ හැකි ය. 1988 අංක 16 දරන පනතින් සංශෝධනය කරන ලද 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 119 ආ වගන්තිය යටතේ ඒ සම්බන්ධ ප්‍රතිපාදන සලසා ඇත.

02. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත්‍ර සියලුම දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබා ගත හැකිය. නීත්‍යානුකූලව නාමයෝජනා දැන්වීමේ දින සිට දින 7ක් ඇතුළත දී, එනම් 2024 අගෝස්තු මස 01 දින හෝ ඊට පෙර අදාළ ඉල්ලුම්පත්‍ර මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය, සරණ මාවත, රාජගිරිය යන ලිපිනයට එවිය යුතු ය.

03. ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී ලවා ඉල්ලුම්පත්‍ර සහතික කරවා ගත යුතු අතර ජාතික හැඳුනුම්පතේ අංකය ඉල්ලුම්කරු විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කිරීම අවශ්‍ය වේ. ග්‍රාම නිලධාරී සහතිකය නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1A - G 42321 — 54 (2024/07)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

04. ඉල්ලුම්කරුවන් විසින් 2024 වර්ෂයේ ඡන්ද විමසීම සඳහා වලංගු ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් තොරතුරු ඉල්ලුම්පත්වල සැපයිය යුතු අතර එම නාමලේඛන තොරතුරු සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල/ කච්චේරිවල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් හෝ මැතිවරණ කොමිෂන් සභාවේ www.elections.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 ජූලි මස 26 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය,

EOG 07 - 0254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.